**2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ 2(අ) සහ 11(1)(උ) වගන්තිවලට අනුකූලව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස් කොට ඇති සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති**

# හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් - 2021

# පටුන

## හැඳින්වීම

2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත.

වන්දිමය සහන ප්‍රදානය හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය.

2018 වර්ෂයේ හානිපූරණ පනතට අනුව හානිපූරණ ප්‍රතිපත්ති සකස් කිරීම.

## ව්‍යවස්ථාපිත විධිවිධාන

## ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය

## ප්‍රතිපත්ති

i. ජීවනෝපාය ආධාර.
ii. වන්දි හා මූල්‍යාධාර.
iii. ඉඩම් අයිතිය නැවත ලබාදීම.
iv. නිවාස සැපයීම.
v. ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
vi. පරිපාලන සහන.
vii. මනෝ සමාජීය සහාය.
viii. සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම වැඩි දියුණුව සඳහා පියවර.

## මාර්ගෝපදේශයන්

1. වින්දිත කේන්ද්‍රීයතාව.
2. සන්තාපයේ ස්වභාවය හා ඒවායේ බරපතලකමට අදාල වන නිර්ණායක ඇතුළුව පීඩාවට පත් තැනැත්තන් සඳහා හානිපූරණයන් ලබා ගැනීම සඳහා වන නිර්ණායක.
3. යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය.
4. මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක.
5. නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක.
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්.
7. සත්‍යාපනය කරන ලද හානිපූරණය සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක.
8. තත්‍යභාවය සත්‍යාපනය කිරිමේ නිර්ණායක.
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම හා ස්මාරක සඳහා වන නිර්ණායක.
10. පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම.

## හැඳින්වීම

**2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත**

2018 අංක 34 දරණ හානිපූරණය සඳහා වන කාර්යාලය පනත (හානිපූරණ පනත) 2018 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලදුව, 2018 ඔක්තෝබර් මස 22 දින සිට ක්‍රියාත්මක වේ. හානිපූරණ පනතෙහි ප්‍රධානතම අරමුණ වන්නේ විවිධ තත්ත්වයන් යටතේ සන්තාපයන්ගෙන් පීඩා විඳි පුරවැසියන්ට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනංවා ගැනීමට හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සහය වීමේ හා උපකාර කිරීමේ අරමුණ පෙරදැරිව රජය විසින් එවැනි පුද්ගලයන් හට ලබා දෙනු ලබන ප්‍රදානයන්, පිළියම් හා සහනයන් සඳහා රාමුවක් සකස් කිරීමයි. පනතෙහි පූර්විකාවෙහි විශේෂයෙන්ම දක්වා ඇති පරිදි, මෙහි මූලික අභිප්‍රාය වන්නේ අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව සඳහා වන සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා දායකත්වය ලබා දීමයි. හානිපූරණ පනතෙහි 27 වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති සුවිශේෂී අවස්ථානුගත කරුණු යටතේ පීඩාවිඳි ශ්‍රී ලංකාවේ පුරවැසියන් හට සහය වීම තුළින්, ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනැංවීම හා යථාතත්ත්වයට පත් කිරීම හා, එමඟින් අනාගත පරපුර ඇතුළත් සියළු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම ළඟා කර ගැනීම සඳහා වේ.

පීඩාවට පත් තැනැත්තන් හට හානිපූරණයන් ප්‍රදානය කිරීමේ රාජ්‍ය කර්තව්‍ය යම් වරදක් පිළිගැනීමේ වගකීම මත පමණක් පදනම් නොවන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුව්‍යවස්ථා 12 (1) යටතේ සෑම පුද්ගලයෙක් සඳහාම නීතියේ සර්ව සාධාරණ රැකවරණය ලබා දීම සහතික කිරීම තුළ අන්තර්ගත වන හුදෙක්ම රාජ්‍යක වගකීම වන එහි පුරවැසියන් ආරක්ෂා කිරීම මත පදනම් වේ. හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා වූ මූලකාරණය හානිපූරණ පනතෙහි පූර්විකාවේ පැහැදිළිව දක්වා ඇති අතර එය පහත පරිදි වේ:

> *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ආවේණික ගරුත්වය සහ සමාන සහ අහිමි කළ නොහැකි මානව හිමිකම් සහ මේ අයිතීන්ට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන රාජ්‍ය වගකීම පිළිගන්නා හෙයින් ද:*
>
> *සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාවර වූ සවලදායී ප්‍රතිකර්මයක් වශයෙන් පරිපූර්ණ හානිපූරණය කිරීමේ යෝජනා ක්‍රමයක් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන හෙයින් ද:"*

හානිපූරණය සඳහා වන කාර්යාලයේ විධි නියෝගයන් රටෙහි ඕනෑම ප්‍රදේශයක ජීවත්වන හෝ ජීවත් වූ සියලුම "පීඩාවට පත් තැනැත්තන්" හට සහනයන් ප්‍රදානය කිරීම දක්වා පුළුල් කර ඇත. හානිපූරණ පනත යටතේ සහනයන් ප්‍රදානය කිරීම යනුවෙන් අදහස් කර ඇත්තේ එක් ප්‍රජාවක, එක් සිදුවීමක් හේතුවෙන් පීඩාවිඳි හෝ එක් කාලයකදී හෝ එක් ප්‍රදේශයක වෙසෙන පුද්ගලයන්ගේ අවශ්‍යතා සැපිරීමට පමණක් සීමා නොකිරීමයි. මෙකී විධිනියෝගය පෙර සිදුවූ සන්තාපයන් පමණක් ආවරණය නොකරන අතර, අනාගතයේදී ඇතිවිය හැකි සන්තාපයන් සඳහා ද ප්‍රතිපාදන සලසනු ලැබේ. පනතෙහි

එන යෝජනා ක්‍රමයේ විධිවිධානයන්ට අනුව හානිපූරණය සඳහා වන කාර්යාලය යම් පුද්ගලයකු වාසය කරන ස්ථානය හෝ අනෙකුත් වෙනස්වන ඕනෑම සාධකයක් පිළිබඳ නොසලකා සියලු පීඩාවටපත් තැනැත්තන් හට තම සේවාව ලබාදිය යුතුය. එබැවින්, උතුරේ සිට දකුණ දක්වාත්, නැගෙනහිර සිට බස්නාහිර දක්වාත්, රට පුරා වෙසෙන ශ්‍රී ලාංකික ජනයා වෙත තම සේවය ලබා දීම හානිපූරණය සඳහා වන කාර්යාලයේ ව්‍යවස්ථාපිත කාර්යයක් ලෙස දක්වා ඇත.

පනතෙහි **27 වගන්තියෙහි** අර්ථදක්වා ඇති පරිදි **"පීඩාවට පත් තැනැත්තෙක් යනු"**;[1]

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ ඊට සම්බන්ධව හෝ එහි පසුවිපාකයක් ලෙස;[2] හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැළඹීම හේතුවෙන්; හෝ

(iii) ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට, කණ්ඩායම්වලට හෝ ජන කොට්ඨාසවලට වූ හානිය දීර්ඝ සහ බරපතල ස්වභාවයේ හානියන් වීම හේතුවෙන්; හෝ

(iv) 2018 අංක 5 දරන, බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ නිර්වචනය කර ඇති පරිදි වූ බලහත්කාරයෙන් අතුරුදහන්වීමක් හේතුවෙන්, ජීවිතය අහිමිවීම හෝ ඔවුන්ගේ දේපළවලට හෝ හානිවීම හේතුවෙන් පීඩාවට පත් වූ තැනැත්තන්;

(ආ) ඡේදයේ අවස්ථානුගත කරුණුවල සඳහන් මියගිය තැනැත්තෙකුගේ හෝ අතුරුදහන් වූ තැනැත්තකුගේ ඥාතීන්. ''ඥාතීන්'' යන පදයෙන් තවදුරටත් මිය ගිය හෝ අතුරුදන්වූ පුද්ගලයා හා සම්බන්ධ පහත දැක්වෙන පුද්ගලයන් හැඳින්වේ - කලත්‍රයා, ළමයින්, දෙමාපියන්, සහෝදරයන් හෝ සහෝදරියන්, නැන්දණියන්/ මාමණ්ඩිවරු, මස්සිනාවරුන්/ නෑනාවරුන්, බෑණාවරුන්/ ලේලිවරුන්, මුණුබුරු මිණිබිරියන් සහ සීයලා ආච්චිලා.

## <u>වන්දිමය සහන ප්‍රදානය හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය</u>

පුද්ගලයන්ට ඔවුන්ගේ පාලනයෙන් බැහැරව සිදු වූ තුවාල වීම්, දේපළ අහිමි වීම් හා විනාශ වීම් මෙන්ම ජීවිතය අහිමි වීම් වෙනුවෙන් වන්දි සහනයන් ප්‍රදානය කිරීමේ ප්‍රත්පත්තියක් ශ්‍රී ලංකාව විසින් ඉතා දිගු කලක සිටම හඳුනාගෙන ඇත. වර්ෂ 1983 ජූලි මස සිදු වූ සිදුවීම් වලින් පසුව මෙම ප්‍රතිපත්ති මාලාව ප්‍රථම වරට හඳුනාගෙන ඇත. එවකට සිදු වූ සිදුවීම් සඳහා රජයක් ලෙස මැදිහත් වීමේ හදිසි

*[1] පනතෙහි 27 වගන්තිය සකස්කොට ඇත්තේ හානිපූරණය සඳහා වන කාර්යාලය කෙටුම්පතෙහි ව්‍යවස්ථාපිතභාවයෙහි නිර්ණනය පිළිබඳව 2018 ජූලි 26 දිනැති ශ්ශේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශයන්ට අනුකූලවයි - ශ්‍රේ.අධි අයදුම්පත් අංක 19/2018 හා 20/2018*

*[2] මෙම අර්ථදැක්වීම යටතේ එකී ගැටුම හෝ හානිය සිදුවන විට ඒවායෙන් පීඩා විඳි තැනැත්තන් රටෙහි කුමන ප්‍රදේශයක ජීවත්වූයේද යන්න නොසලකා ගැටුම් වල ප්‍රතිඵලයක් ලෙස පීඩා විඳි සියලුම තැනැත්තන් මේ සඳහා ඇතුළත් වේ. උතුරු හා නැගෙනහිර පළාත් වල ජීවත් වූ තැනැත්තන් පමණක් නොව, රජයේ ආරක්ෂක අංශ වල හා පොලීසියේ සාමාජිකයින් ඇතුළුව ගැටුම් හේතුවෙන් හානිවීමකින්/ අලාභයකින් පීඩාවිඳි පෙර කී පළාත් වලට පරිබාහිරින් ජීවත් වූ තැනැත්තන් ද පීඩාවට පත් තැනැත්තන් ලෙස ඇතුළත් වේ.*

අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, දේපල, ව්‍යාපාර, කර්මාන්ත වලට වූ හානි පිළිබඳ කටයුතු කිරීම සඳහා හදිසි නීතිය පැනවීමට මහජන ආරක්ෂණ ආඥා පනතෙහි විධිවිධාන යොදාගන්නා ලදී. 1983 හදිසි නීති අංක 01[3] (විපතට පත් වූ දේපල, ව්‍යාපාර සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය) මඟින් "දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය" පිහිටුවීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර විපතට පත් වූ දේපල අළුත්වැඩියා කිරීම හා ප්‍රතිෂ්ඨාපනය මෙන්ම විපතට පත් වූ කර්මාන්ත හා ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීම[4] සඳහා අදාල විධිනියෝගයන් එහි දක්වා ඇත. හානියට පත් දේපල සඳහා මෙන්ම විපතට පත් තැනැත්තන් සඳහා ද සහන ප්‍රදානය කිරීම දක්වා එම පනත පුළුල් කර, 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ පනත (පුනරුත්ථාපාන අධිකාරී පනත) පනවා වර්ෂ 1987 පසුව විපතට පත්වූ තැනැත්තන් සඳහා සහන ලබා දීමේ විධිවිධාන පනවන ලදී. 2018 වර්ෂයේදී එය ඉවත් කර වඩාත් අභිලාෂකාමී පනතක් වන වත්මන් හානිපූරණ පනත ප්‍රතිස්ථාපනය කිරීම තෙක් මෙම පනත බලපැවැත්විණි. පුනරුත්ථාපන අධිකාරී පනත යටතේ වෙනත් කරුණු අතුරින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා, ජනවාර්ගික අර්බුධ හා සිවිල් කැළඹීම් හේතුවෙන් අහිමි වීමකින් හෝ හානිවීමකින් පිඩා විඳි පිඩාවට පත් තැනැත්තන් හට සහන සලසන ලදී. තවද, විවිධ අවස්ථාවන් වලදී ස්වාභාවික විපත් හා ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පීඩාවිඳි තැනැත්තන් හට අනුප්‍රාප්තික රජයන් විසින් හානිපූරණයන් ලබාදී ඇත. මේ සඳහා ආසන්නතම උදාහරණ ලෙස: අළුත්ගම හා දිගන ප්‍රදේශවල ඇති වූ සිදුවීම් හේතුවෙන් නිවාස අහිමි වූ ප්‍රජාවන් හට නැවත නිවාස ඉදිකර දීම; හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් පුනරුත්ථාපනය හා නැවත සමාජගත කිරීම; පාස්කු ඉරුදින ප්‍රහාරය හේතුවෙන් විපතට පත්වූවන් හට මූල්‍යමය වන්දි ලබාදීම; පසුගිය වකවානුව තුළ ගංවතුර හා නායයෑම් හේතුවෙන් විපතට පත්වූවන්හට මානුෂීය සහනාධාර ලබාදීම ආදිය දැක්විය හැකිය.

**<u>2018 වර්ෂයේ හානිපූරණ පනතට අනුව හානිපූරණ ප්‍රතිපත්ති සකස් කිරීම.</u>**

හානිපූරණ පනතේ 2(අ) සහ 11(1)(උ) වගන්ති අනුව පීඩාවට පත් තැනැත්තන් හට තනි හා සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමේදී "හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්" පිළිබඳ නිර්දේශයන් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා පහත කරුණු ඇතුළත් කළ යුතුය -

(i) හානිපූරණයන් ලබාදිය හැකි සන්තාපයේ ස්වභාවය හා බරපතලකම ආදී නිර්ණායක ඇතුළත් පීඩාවට පත් තැනැත්තන් හට හානිපූරණයන් ලබාගැනීමට ඔවුන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන්;

(ii) යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් සඳහා ලබාදෙනු ලබන හානිපූරණයන්හි ස්වරූපය, යෝග්‍ය අවස්ථාවන් හා ප්‍රමාණය;

(iii) මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යභාවය පිළිබඳ නිර්ණායක;

(iv) හදිසි හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යභාවය පිළිබඳ නිර්ණායක;

---

[3] *1983 අගෝස්තු 7 දින අතිවිශේෂ ගැසට් නිවේදන අංක 257/3 හි පළවී ඇත.*

[4] *නියෝග වගන්ති 04*

(v) පිඩාවට පත් තැනැත්තන් සඳහා විවිධ ස්වරූපයේ හානිපූරණයන් සැලසීමේදී හෝ ලබාදීමේදී උපකාරයන් ලබාගත හැකි සංවිධානයන් ලැයිස්තුවක්;

(vi) අනෙකුත් රාජ්‍ය ආයතන විසින් හානිපූරණයන් පිළිබඳ සෘජුවම ලබා දෙන නිර්දේශයන්;

(vii) හානිපූරණයන් සඳහා සත්‍යාපනය කරන ලද අයදුම්පත් පිළිබඳ නිර්ණායකයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය;

## ව්‍යවස්ථාපිත විධිවිධාන

ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් විසින් පනතෙහි අඩංගු යෝග්‍ය ව්‍යවස්ථාපිත විධිවිධාන මාර්ගෝපදේශ පහත දක්වා ඇති පරිදි භාවිතා කරන ලදී.

පනතෙහි **2 වගන්තිය** මඟින් දක්වා ඇති පරිදි පනතෙහි අරමුණු වන්නේ -

(අ) පීඩාවට පත් තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමට හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර කැබිනට් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ආ) මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම; සහ

(ඈ) යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අගය කිරීම.

එහෙයින්, පනත යටතේ ලබාදෙනු ලබන සහනයන්හි වැඩි කොටස අදාල කරුණ සඳහා වගකියනු ලබන අදාල රේඛීය අමාත්‍යාංශ හෝ රාජ්‍ය, රජයේ හෝ නාගරික දෙපාර්තමේන්තු හෝ අනෙකුත් අධිකාරීන් මඟින් ලබාදීමට හානිපූරණ පනත අදහස් කරයි. හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්යයභාරය වන්නේ හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට නිර්දේශ කිරීම, සහ අමාත්‍ය මණ්ඩලය විසින් එකී ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් අනතුරුව, එක් එක් විෂයයන්ට අදාල රාජ්‍ය, රජයේ හෝ නාගරික අධිකාරීන් මඟින් මෙන්ම, අදාල වනසේ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් හෝ, තනි හෝ සාමූහික හානිපූරණයන් ලබාදීම, සහ පීඩාවට පත් තැනැත්තන් සඳහා හානිපූරණයන් ලබාදීමේ ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයුම් කිරීමයි.

හානිපූරණ පනතෙහි විධිවිධාන අනුව, හානිපූරණය සඳහා වන කාර්යාලයට විමර්ශනය කිරීම හා අධිකරණ කටයුතු සිදු කිරීම පවරා නොමැති අතර, කිසිදු පුද්ගලයකු විසින් සිදු කරන ලද වරදක් විමර්ශනය කිරීමේ අධිකාරී බලය ද නොමැත. එහි ව්‍යවස්ථාපිත කාර්යභාරය වන්නේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු විට එකී ප්‍රතිපත්තීන් යටතේ හානිපූරණයන් ලැබීමට අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය මැන බැලීම, සහ අනුමත ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්වලට අනුකූලව එකී පුද්ගලයන් හට ගැළපෙන පරිදි යෝග්‍ය තනි හෝ සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීම වේ.

පුනරුත්ථාපන අධිකාරිය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය අතර පවතින සුවිශේෂී වෙනස්කම වන්නේ සිදුවීම් සිදුවූ අවස්ථා වලදී අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද සුවිශේෂී තීරණ වලට අනුව පුනරුත්ථාපන අධිකාරිය විසින් විවිධ හේතූන් මත පීඩාවිඳි තැනැත්තන් හට මූල්‍යමය වන්දි පිරිනැමීම සිදු කළ අතර, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සංසක්ත ප්‍රතිපත්ති හා පැහැදිළි මාර්ගෝපදේශනයන් මත පදනම්ව මූල්‍යමය වන්දිවලට එහා ගිය තනි හා සමූහ හානිපූරණයන් පිරිනැමීම හානිපූරණ පනත මඟින් කටයුතු කරනු ලබයි. ''තනි හානිපූරණයන්'' හා ''සාමූහික හානිපූරණයන්'' හි අර්ථ දක්වා ඇති පරිදි හානිපූරණය යන්නෙහි පුළුල් විෂයපථය පහත පරිදි වේ:

පනතෙහි **27 වගන්තියෙහි** දක්වා ඇති පරිදි **තනි හානිපූරණය** යන්නෙන්, තනි පීඩාවට පත් තැනැත්තකු සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම් පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු අතර, ඊට,

(අ) පීඩාවට පත් තැනැත්තක් සඳහා සපයන ලද යම් මූල්‍යමය ගෙවීම් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ;

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය සහ සහනදායී ණය;

(ඇ) අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම්, සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

(ඈ) පීඩාවට පත් තැනැත්තක් සඳහා සපයන ලද මනෝ සාමාජීය සහය ඇතුළු පරිපාලන සහාය සහ සුභසාධන සේවා;

(ඉ) ඉඩම් සහ නිවාස සැපයීම ඇතුළු ප්‍රතිෂ්ඨාපන පියවර; සහ

(ඊ) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනා ගනු ලැබූ වෙනත් සුදුසු පියවර;

**27 වගන්තියට** අනුව **සාමූහික හානිපූරණ** යන්නෙන්, පීඩාවට පත් තැනැත්තන් කණ්ඩායම් හෝ කොට්ඨාස සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු අතර, ඊට-

(අ) ස්මාරක ඇතුළුව මියගිය තැනැත්තන් අනුස්මරණ ක්‍රම;

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය;

(ඇ) අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම් සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

(ඈ) ප්‍රජා සංවර්ධන වැඩසටහන් හෝ සේවා; සහ

(ඉ) පීඩාවට පත් ජන කොට්ඨාස සමඟ සිදු කළ මහජන තොරතුරු විමසීම් තුළින් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනාගනු ලැබූ වෙනත් සුදුසු වැඩසටහන්.

මෙහි හරය නම්, තනි ප්‍රතිලාභ ප්‍රදානය කිරීමෙන් වෙනස්ව සාමූහික හානිපූරණයන්හි අරමුණ වන්නේ සමූහයක් ලෙස යම් කණ්ඩායමකට, ප්‍රජාවකට, ජනගහනයකට, ගමකට, දිස්ත්‍රික්කයකට, පළාතකට ප්‍රතිලාභ ලබා දීමයි. සාමූහික හානිපූරණයන් මඟින් සමූහයක් ලෙස ජන කොට්ඨාශයක් සඳහා ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ. මෙකී පියවර මඟින් මූලික අවශ්‍යතා සපුරනවා මෙන්ම සාමකාමී පශ්චාත් යුධමය සමාජයන් ගොඩනැඟීමේ දිගු කාලීන අරමුණ සඳහා ද දායකත්වය සපයයි. සාමූහික ප්‍රතිකර්මයන්හි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒ මඟින් ඉහත දක්වා ඇති ආකාරයේ යෝග්‍ය සෑම පීඩාවට පත් තැනැත්තෙකු වෙතම ළඟා වීමට ඇති හැකියාවයි.

ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී හානිපූරණය සඳහා වන කාර්යාලය මෙහෙයවිය යුතු ප්‍රතිපත්තීන් කිහිපයක් හානිපූරණ පනතෙහි දක්වා ඇත.

**12(1)(ඈ) වගන්තියට** අනුව වෙනස්කම්වලට පාත්‍ර නොකිරීම, වින්දිත-කේන්ද්‍රීයතාව සහ සාධාරණවත්වය මඟින් සහ ස්ත්‍රීන්, ළමයින් සහ ආබාධ සහිත තැනැත්තන් කෙරෙහි නිසි සැලකිල්ලක් සහිත බව ආදී ප්‍රතිපත්තීන් වලට අනුකූල වීම අවශ්‍ය වේ.

**12(1)(ඈ) වගන්තියට** අනුව ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී සැලකිළිමත් විය යුතු කරුණු පහත පරිදි වේ;

(i) පීඩාවට පත් තැනැත්තාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ බරපතළකම;

(ii) අඛණ්ඩ ශාරීරික, මානසික සහ ආර්ථිකමය බලපෑම ඇතුළුව, එවැනි උල්ලංඝනය වීමක් මඟින් පීඩාවට පත් තැනැත්තන් මත ඇති වන බලපෑම;

(iii) ස්ත්‍රීන්, ළමයින් සහ ආබාධ සහිත තැනැත්තන් ඇතුළුව අනාරක්ෂිත පීඩාවට පත් තැනැත්තන් සඳහා විශේෂ පියවර සලසාදීමේ අවශ්‍යතාවය;

(iv) ප්‍රශ්නගත අයිතිවාසිකම් උල්ලංඝනය විමට අදාළව පීඩාවට පත් තැනැත්තන් විසින් දැනටමත් ලබා ඇති හානිපූරණ සඳහා හේතු දැක්වීමේ අවශ්‍යතාවය;

(v) මූල්‍යමය හානිපූරණ ප්‍රදානය කිරීමේ දී, සම්පත්වල සුලභතාවය ඇතුළත්ව සම්පූර්ණ මුදල් එකවර ගෙවීම සහ අසමාන කොටස් වශයෙන් ගෙවීම ඇතුළු ගෙවීම් ආකාර අතරින් ගෙවීම් සිදු කළ යුතු ආකාරය තීරණය කිරීමේ දී පීඩාවට පත් තැනැත්තන්ගේ යහපත ඇතුළු සාධක සලකා බැලීම;

(vi) මූල්‍යමය නොවන හානිපූරණවල යෝග්‍යභාවය;

(vii) මූල්‍යමය වන තනි හානිපූරණ ප්‍රදානය කිරීමේ දී වඩාත් බරපතළ සන්තාපයක් සහිත පීඩාවට පත් තැනැත්තන් වෙනුවෙන් එම හානිපූරණ ලබා දීම සීමා කිරීමේ අවශ්‍යතාවය;

(viii) පීඩාවට පත් තැනැත්තාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ බරපතළකම, පීඩාවට පත් තැනැත්තන්ගේ දිළිඳු බව සහ සම්පත්වල සුලභතාවය සලකා බලමින් මූල්‍යමය හානිපූරණ ලබාදීමට ප්‍රමුඛතාවය ලබාදීමේ අවශ්‍යතාවය;

(ix) මිය ගිය හෝ අතුරුදහන් වී ඇති තැනැත්තකු සම්බන්ධව ඥාතීන් බොහෝ ප්‍රමාණයක් හිමිකම් ප්‍රකාශ කර සිටින අවස්ථාවක දී සහන බෙදාහැරීමේ ක්‍රමානුකූල සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය;

**12(1)(ඉ) වගන්තියට** අනුව සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමේදී වෙනස්කම්වලට පාත්‍ර නොකිරීම, ප්‍රතිසන්ධාන පහසුකම් සැලැස්වීම සහ සියලු පීඩාවට පත් තැනැත්තන්ගේ අත්දැකීම් වලට සංවේදී වීමේ හැකියාව තහවුරු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

ඉහත සඳහන් ව්‍යවස්ථාපිත විධිවිධානවල අඩංගු වන මූලධර්ම හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් සම්පාදනය කරන ලද හා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්වල අන්තර්ගත වේ.

## <u>ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය</u>

පනතෙහි 12(1)(අ) වගන්තිය අනුව පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නැවත ගොඩනැංවීම සඳහා වන අවශ්‍යතා නිශ්චය කරගැනීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සකස් කිරීමේදී යෝග්‍ය ක්‍රම මඟින් පීඩාවට පත් තැනැත්තන්, පීඩාවට පත් තැනැත්තන්ගේ ඥාතින් නියෝජනය කරන සංවිධාන සහ වෙනත් යම් අධිකාරයන්, තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල විමසීම ආදිය සිදු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පහත පරිදි තොරතුරු විමසීම සඳහා වූ මහජන වැඩසටහන් පවත්වන ලදී.

අ) හඳුනාගත් දිස්ත්‍රික්කයන්හි පවත්වන ලද මහජන තොරතුරු විමසීමේ වැඩසටහන්

අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහාය ඇතිව පහත දිස්ත්‍රික්කයන්හි මහජන තොරතුරු විමසීමේ වැඩසටහන් පවත්වන ලදී -

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිනය |
|---|---|---|---|
| 01 | මන්නාරම | මුසලි | 2019.08.28 |
| | | මඩු | |
| 02 | කිලිනොච්චි | පලෙයි | 2019.09.26 |
| | | පූනගරි | |
| 03 | මුලතිව් | පුදුකුඩියිරිප්පු | 2019.09.27 |
| | | කරෙයිතුරෙයිපත්තු | |
| 04 | යාපනය | තෙල්ලිපලෙයි | 2019.12.09 |
| | | වෙලනෙයි | |
| | | චාවකච්චේරි | 2019.12.10 |
| | | මරුතන්කර්නි | |
| 05 | මඩකලපුව | දිස්ත්‍රික්කයේ කොට්ඨාශ 14 ක | 2019.12.17 |
| 06 | මාතර | අකුරැස්ස | 2019.12.20 |
| | | හක්මන | |
| 07 | හම්බන්තොට | හම්බන්තොට | 2020.02.17 |

ඉහත දැක්වූ තොරතුරු විමසීමේ වැඩසටහන් එකී ප්‍රදේශයන්හි දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ද සහය ඇතිව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සංවිධානය කරන ලදුව ඒ ඒ ස්ථානයන්හිදීම පවත්වන ලදී. මෙම හමුවීම් සඳහා ප්‍රධාන වශයෙන්ම ඒ ඒ ප්‍රදේශයන්හි පදිංචි වී සිටින, ත්‍රිවිධ හමුදාවන් සහ පොලීසියේ සාමාජිකයින් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ඇතුළුව පනතෙහි 27 වගන්තිය යටතේ දක්වා ඇති හඳුනාගත් හේතූන් නිසා පීඩාවට පත් තැනැත්තන් බොහෝ දෙනෙක් සහභාගී වූහ. මේ අයගේ ප්‍රබලතම ඉල්ලීම වූයේ ජීවිත නැවත ගොඩනංවා ගැනීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සමාජ ආර්ථික සහාය ලබා ගැනීම විය.

මහජන තොරතුරු විමසීමේ වැඩසටහන් වලට සහභාගී වීම සඳහා ඇරයුම් කරන ලද පීඩාවට පත් තැනැත්තන් වන්නේ:

- අතුරුදන්වූ තැනැත්තන්ගේ මව්වරුන් හා බිරින්දෑවරුන් ඇතුළු ගෘහමූලික කාන්තාවන්;
- ගැටුම්, සිවිල් කැළඹීම් හා දේශපාලන නොසන්සුන්තා වලදී මියගිය පුරුෂයින්ගේ බිරින්දෑවරුන්;
- අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ හා/ හෝ නැවත පදිංචි කරන ලද පුද්ගලයින්;
- ආබාධ සහිත තැනැත්තන්;
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා වලදී තුවාල ලැබූ තැනැත්තන්;
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා වලදී මියගිය තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින්;
- විශ්‍රාම ලද හෝ ආබාධිත තත්ත්වයට පත් වූ රජයේ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අය;
- රජයේ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ මියගිය හෝ අතුරුදන්වූ සාමාජිකයින්ගේ පවුල්වල අය;
- පුනරුත්ථාපනය කරන ලද හා නැවත සමාජගත කරන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හිටපු සාමාජිකයින්;
- ඉන්දියාවේ සිට නැවත පැමිණි සරණාගතයින්;
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තාවල ප්‍රතිඵලයක් ලෙස මානසික පීඩාවන්ට ලක්වූ තැනැත්තන්;
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා අතරතුර දේපල (නිශ්චල හා චංචල යන දෙකම) අහිමි වූ තැනැත්තන්;

ආ) පීඩාවට පත් තැනැත්තන් නියෝජනය කරමින් සිවිල් සංවිධාන සමඟ පැවති තොරතුරු විමසීමේ වැඩසටහන් - මෙම තොරතුරු විමසීමේ වැඩසටහන 2019 දෙසැම්බර් 03 දින පවත්වන ලදී. මේ සඳහා දිවයින පුරා ඇති සංවිධාන 13 ක් සහභාගී විය.

ඇ) සංක්‍රාන්තික යුක්තිය හා සංහිඳියාව සඳහා වූ යෝජිත යාන්ත්‍රණයන් පිළිබඳ මහජනයාගේ අදහස් හා ප්‍රතිචාර විමසීම සඳහා 2016 ජනවාරි මස ''ප්‍රවිචාරණ කාර්යය සාධක බලකාය'' සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. මේ අනුව, හානිපූරණ පනත බලපැවැත්වීමට ප්‍රථම මෙම කාර්යය සාධන බලකාය විසින් රටපුරා සිටින පීඩාවට පත් තැනැත්තන් සමඟ පැවැත් වූ තොරතුරු විමසීමේ පුළුල් වැඩසටහන් මත පදනම්ව එකී පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා පිළිබඳ ඔවුන් සතුව විශාල තොරතුරු ප්‍රමාණයක් පැවති හෙයින්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් එම කාර්යය සාධන බලකායේ සාමාජිකයින් හමුවී පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා හා තත්ත්වයන් පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් ලබාගන්නා ලදී.

මෙහිදී ප්‍රවිචාරණ කාර්යය සාධක බලකාය විසින් සකස් කරන ලද 2016 නොවැම්බර් අවසාන වාර්තාව හා උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමෙහි 2011 නොවැම්බර් වාර්තාව ද මෙහිදී පරීක්ෂා කරන ලදී.

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් සම්පාදනය කරන ලද්දේ ඉහත සඳහන් විමසීම් හා වාර්තා කිරීමෙන් අනතුරුවය.

## <u>ප්‍රතිපත්ති</u>

රටේ විවිධ පළාත් වල පැවැත්වූ තොරතුරු දැනගැනීමේ වැඩසටහන් මඟින් උතුරු, නැගෙනහිර, දකුණ හෝ බස්නාහිර ආදී කුමන පළාතක වෙසෙන තැනැත්තන් වුව ද, පීඩාවට පත් තැනැත්තන් අතර ඇති සම අවශ්‍යතා අනාවරණය කරගැනීමට හැකිවිය. මෙහි දක්වා ඇති ඇතැම් කරුණු සමස්ථයක් ලෙස ගත් කළ පුළුල් ප්‍රජාවන් සඳහා පොදු බව සඳහන් කළයුතු අතර සහ එහි ප්‍රතිඵලයක් ලෙස හානිපූරණයන් ලෙස ලබා දිය හැකි ඇතැම් මැදිහත්වීම් ප්‍රජාවෙහි ඇති පුළුල් කණ්ඩායම් වලට අවශ්‍ය වන නමුත් පහත මඟින් දක්වා ඇති පරිදි, පීඩාවට පත් තැනැත්තන්ගේ අවධානම් සහිත බවේ වර්ධනය හේතුවෙන් ඔවුන්ගේ අවශ්‍යතා වලට ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු වේ.[5]

පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත නැවත ගොඩනැංවීමට හා ප්‍රතිෂ්ඨාපනය කිරීමට රජය විසින් කුමන ආකාරයේ සහන පියවරයන් හා ආධාර ලබාදිය යුතු ද යන කරුණ සැලකිල්ලට ගනිමින් එමඟින් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව වර්ධනය කිරීම උදෙසා, අවශ්‍යතාව මත පදනම්ව පහත ආකාරයේ හානිපූරණයන් ප්‍රදානය කරනු ලැබේ.

### I. ජීවනෝපාය ආධාර

ජීවනෝපාය ආධාර උත්පාදනය කිරීම කඩිනම් අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත. ආර්ථික බලගැන්වීම තුළින් පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත නැවත ගොඩනැංවීම හා ප්‍රතිෂ්ඨාපනය කරගැනීමට හා අර්ථවත් ලෙස ඔවුන් හට සහය වීමට හැකි තරමේ ප්‍රායෝගික පියවර හා වැඩසටහන් ක්‍රියාවට නැංවීම මෙයින් අදහස් වේ. එක් අතකින් මෙය පීඩාවට පත් තැනැත්තන් හට ඔවුන්ගේම වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන්ව බලගන්වන අතර, අනෙක් අතට මේ මඟින් ඔවුන් රජයේ දීමනාව මත යැපීම තුරන් කර දැමිය හැක. පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවනෝපාය ආධාර සඳහා පහත දක්වා ඇති ආකාරයේ මැදිහත්වීම් දායක වනු ඇත:

- ගොවි ප්‍රජාවන් හට සහය වීම සඳහා වාරිමාර්ග/ කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සැපයුම්වලට ප්‍රවේශ ලබා දීම;
- පීඩාවට පත් තැනැත්තන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන දරිද්‍රතාවය අඩුකිරීමේ විවිධ වැඩසටහන් සඳහා ඇතුළත් කිරීම;
- විපතට පත් ප්‍රදේශ වල ජීවනෝපාය මාර්ග, හා ස්වයං රැකියා අවස්ථා උත්පාදනය කිරීම.

### II. වන්දි හා මූල්‍යාධාර

වන්දි ප්‍රදානය මඟින් විශේෂයෙන්ම පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත පෙර තිබූ තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය හා නැවත පිහිටුවිය නොහැකි වුව ද, කාලීන හා ප්‍රමාණවත් වන්දියක් ලබා දීම ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනැංවීමට හැකියාවක් ඇති කිරීම සඳහා වන වැදගත් අංගයකි. අර්ථවත් සමාජ ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම තවත් වැඩසටහනක් වේ. දිළිඳුකමේ මට්ටම හා පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතාව මත පදනම්ව මාසික සමාජ ආරක්ෂණ දීමනා යෝජනා ක්‍රමයක් ස්ථාපනය

[5] 12(1) (ඈ) (viii) වගන්තිය

කිරීම, ණය පියවීමට හැකියාවක් නොමැති පීඩාවට පත් තැනැත්තන් හට ඔවුන්ගේ මූල්‍යමය ණය සඳහා සහය හෝ ණය සහන ආධාර ලබා දීම, හෝ ඔවුන්ගේ ණයගැතිබව අවම කිරීම සඳහා පියවර ගැනීම තවත් අත්‍යාවශ්‍යම මැදිහත්වීමක් ලෙස දැක්විය හැකිය. සම්පත් සුලභතාවය මත හානිපූරණයන් සැපයීමේ අවශ්‍යතාවය සලකා බැලීමේදී[6], ජීවිත හානි සඳහා මූල්‍යමය වන්දි ලෙස ලබා දිය හැකි වන්දි මුදලක් තීරණය කර ඒ අනුව වන්දි මුදල් ප්‍රදානය කිරීමත් හා ආබාධිත තත්ත්වයන්ට පත් තැනැත්තන් සඳහා ද සමානුපාතික ලෙස වන්දි මුදල් ලබා දීම වැදගත් වේ. මේ සම්බන්ධයෙන් වන නිර්දේශයක් මාර්ගෝපදේශවල සඳහන් කර ඇත.

### III.ඉඩම් අයිතිය නැවත ලබාදීම

ඉඩම්වල අයිතිය නැවත ලබා දීම ශ්‍රී ලාංකික සමාජයේ සුවිශේෂී වැදගත්කමක් ඇති දෙයකි. පීඩාවට පත් තැනැත්තන් ඉඩම්වල අයිතීන් සම්බන්ධයෙන් පහත ආකාරයන් අනුව විපතට පත් වී ඇත -

(i) ඉඩම් පවරා ගැනීමේ නීති යටතේ රජය විසින් නීත්‍යානුකූලව පවරාගත් ඉඩම් වල අයිතිකරුවන් හා වන්දි නොලද පුද්ගලයන්;

(ii) ඉඩම් පවරා ගැනීමේ නීති මඟින් හැර පොදු/ රජයේ කරුණු සඳහා පවරාගත් ඉඩම්වල හිමිකරුවන්, සහ වෙනත් කිසිදු ආකාරයකින් වන්දි නොලද හෝ විකල්ප ඉඩම් නොලැබුණු අය.

ඉහත අවස්ථා වලදී, නීත්‍යානුකූල හිමිකරුවන්හට ඉඩම් මුදා හැරිය හැකි විට කඩිනමින් එම ඉඩම් මුදා හැරීම සහ ඉඩම් මුදා හැරිය නොහැකි අවස්ථාවලදී ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්හට කඩිනම් වන්දි ගෙවීමක් හෝ වෙනත් විකල්ප ඉඩම් ලබා දීම මඟින් ඉහත ගැටළුව අවම කරගත හැකිවනු ඇත.

ගැටුම් අතරතුරදී හෝ අස්ථානගත වීම හේතුවෙන් අවශ්‍ය ලිපිලේඛන නොමැති වීම නිසා නැවත ඉඩම් ලබා ගැනීමේදි හෝ වන්දි සුරක්ෂිත කරගැනීමට උත්සාහ දැරීමේ දී නිළධාරීවාදය හේතුවෙන් අපහසුතාවන්ට මුහුණ පෑ ඇතැම් පීඩාවට පත් වූ තැනැත්තන් විසින් මතුකළ ගැටළුවලට ප්‍රතිචාර දැක්වීම පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම වැදගත් වේ. එවැනි පීඩාවට පත් තැනැත්තන් හට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් පවත්වාගෙන යන ලේඛන උපයෝගී කරගනිමින් ඔවුන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා සහය ලබා දිය හැකිය. ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය සතුව එවැනි ලේඛන නොමැති විට ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා වන සරල ක්‍රමවේදයක් ඇති කිරීම පිළිබඳව ද සැලකිලිමත් විය හැකිය. ඉඩම් පවරා ගැනීමේ නීති යටතේ පීඩාවට පත් තැනැත්තන් හට ඔවුන්ට ලැබිය යුතු වන්දි මුදල් ලබා දීමේ දී අදාල අධිකාරීන්වල සහය ලබා දීම මඟින් මෙවැනි ගැටළු කඩිනම්ව විසඳිය හැකි වනු ඇත.

හානිපූරණ විධික්‍රමයක් ලෙස ඉඩම් නැවත පවරාදීම ඇතුළත් කිරීම මඟින්, පීඩාවට පත් තැනැත්තන්, විශේෂයෙන්ම කාන්තාවන්, අතර පවතින ඉඩම් නොමැතිකම හා හිමිකාරීත්වයේ මූලාශ්‍ර නිසා හටගත් දරිද්‍රතාවය සහ අවස්ථාවන් හිඟ බව ආදී ගැටළු වලට පිළියම් යෙදීමට ද හැකියාවක් ලැබෙනු ඇත.

---

[6] 12(1)(ඇ)(v) වගන්තිය

### IV.නිවාස සැපයීම

මහජන තොරතුරු විමසීමේ වැඩසටහන් අතරතුර හඳුනාගැනීමට හැකි වූ තවත් කරුණක් නම් පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත සාමාන්‍ය තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනයට කිරීමේදී වැඩිදුර බාධාවක් ලෙස විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල පවතින නිවාස හිඟකම දැක්විය හැකිය. එවැනි පීඩාවට පත් තැනැත්තන් තුන් ආකාරයකි:

1. කිසිදු නිශ්චල දේපලක් නොමැති තැනැත්තන්;
2. ඉඩමක් ඇතත් නිවසක් සාදා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් නොමැති තැනැත්තන්;
3. ඔවුන්ගේම නිවසක් තනා ගැනීමට රජය විසින් පාර්ශ්වික සහයක් ලබාදුන් නමුදු නිවස තනා අවසන් කිරීමට එම අරමුදල් ප්‍රමාණවත් නොවන තැනැත්තන්.

රජය මඟින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන සැමට සෙවණක් යන ප්‍රතිපත්තිය නිසා පරිදි නිවාස නොමැති පීඩාවට පත් තැනැත්තන් හට නිවාස ඉදිකරගැනීමට අත්වැලක් වනු ඇත. රජය විසින් නව නිවාස ඉදිකර දීම හෝ තිබූ නිවාස යළි ඉදිකිරීම හෝ, පීඩාවට පත් වූවන්ට තමන්ගේම නිවසක් තනා ගැනීමට අවශ්‍ය වන අර්ථවත් මූල්‍යමය ආධාර ලබා දීම හෝ අවතැන් වූවන් හට නව නිවාස ලබා දීම ආදිය මේ සඳහා ගත හැකි අවශ්‍ය පියවර ලෙස දැක්විය හැකිය. මෙහිදී "අර්ථවත් මූල්‍යමය ආධාර" ලෙස දක්වා ඇත්තේ පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවන තත්ත්වය සේම භූගෝලීය අවශ්‍යතා මත පදනම්ව ප්‍රතිලාභීන් හට නිසි වාසස්ථානයක් ලබා දීමයි.

### V. ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

හානිපූරණ වැඩසටහන් වලදී අවධානය යොමු කළ යුතු තවත් ක්ෂේත්‍රයක් නම් ජනාවාසයන් තුළම ප්‍රවේශ මාර්ග, පාලම්, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, පොදු ප්‍රවාහනය, රෝහල්, සායන සහ පාසල් ආදී ප්‍රජා යටිතල පහසුකම් හා මූලික පහසුකම් හිඟවීමේ ගැටළුවයි. මෙවැනි පීඩාවට පත් තැනැත්තන් බොහෝ ප්‍රමාණයක් වෙසෙන අවධානයට යොමු නොවූ ප්‍රදේශ ඉලක්කගත උපකාර හා ආධාර ලබාදිය යුතු ප්‍රදේශ වේ.

ඇතැම් ප්‍රදේශවල ද්විතීය පාසල් අධ්‍යාපනය සඳහා පහසු ප්‍රවිශ්ට මාර්ග නොමැතිවීමේ ගැටළුවට පිළියම් යෙදීම සඳහා මාර්ග පිළිසකර කිරීම, ප්‍රවාහන පහසුකම් සැපයීම ඇතුළු පහසු ප්‍රවිෂ්ට මාර්ග සකසා පහසුකම් සැපයීම ද අවශ්‍ය වේ. සිසුවියන්ට පාසල් පැමිණිය හැකි පරිදි, දුෂ්කර ප්‍රදේශ වල පාසල් සඳහා යෝග්‍ය සනීපාරක්ෂක පහසුකම් ලබාදීම ද අත්‍යාවශ්‍ය වේ. යම් ප්‍රදේශයන්හි හා අන්තර් ගම්මාන ආශ්‍රිතව පෙරපාසල් පිහිටුවීම ද සිදු කළ හැකි තවත් මැදිහත්වීමකි.

ඉහත සඳහන් අවස්ථාවන්වල දී අවධානයට ලක් නොවන දුෂ්කර අන්තර් ජනාවාස සඳහා ප්‍රජා යටිතල පහසුකම් හා මූලික අවශ්‍යතා වන මාර්ග, පාලම්, පානීය ජලය, ළිං, පොදු පහසුකම්, ප්‍රජා ශාලා, පොදු ප්‍රවාහනය, රෝහල් සහ/ හෝ සායන, පාසල් ඇතුළු ප්‍රජා යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් මූලික පහසුකම් ලබාදීම ආදී වැඩපිළිවෙලවල් හානිපූරණ වැඩසටහන්වලට ඇතුළත් කිරීම මඟින් පීඩාවට පත් තැනැත්තන් හට ඔවුන්ගේ ජීවිත ප්‍රතිෂ්ඨාපනය හා ගොඩනංවා ගැනීමට බෙහෙවින් උපකාරී වනු ඇත.

## VI.පරිපාලන සහන

ගැටුම් අතරතුර හෝ අවතැන්වීම හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන් බොහෝ ප්‍රමාණයකට ඔවුන්ගේ වැදගත් ලියකියවිලි අහිමි වී ඇත. එමනිසා, ලේඛන ක්‍රියාවලිය තවත් සරල කිරීමට ක්‍රියාපටිපාටියක් අත්‍යාවශ්‍ය වේ.

කාලානුරූපීව අත්‍යාවශ්‍ය ලේඛන කටයුතු සිදු කිරීම සඳහා අදාල අධිකාරීන් විසින් පීඩාවට පත් තැනැත්තන් හට ලබාදෙන සහය පුළුල් කර ඇත. උදාහරණයක් ලෙස මෙම ගැටළුව අවම කිරීම සඳහා අතුරුදහන් වීමේ සහතිකය, මරණ සහතිකය, අවශ්‍ය කරන අනෙකුත් පරිපාලන ලේඛන මෙන්ම ඡන්ද ලැයිස්තුවෙහි ලියාපදිංචිය, දේපල සඳහා ඔප්පු විධිමත් කිරීම සහ රියදුරු බලපත්‍ර හා ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ පහසුකම ආදිය සඳහා සහාය ලබාදීම අවශ්‍ය වේ.

## VII. මනෝ සමාජීය සහාය

සෞඛ්‍යමත් හා සාමකාමී ජාතියක් මූලිකවම සෑදී ඇත්තේ සිතින් මෙන්ම ගතින් ද සෞඛ්‍ය සම්පන්න ජනතාවකගෙනි. ඒ අනුව නන් අයුරින් කම්පනයට පත්වූ පීඩාවට පත් තැනැත්තන් සඳහා මනෝසමාජීය සහාය ලබාදීම මඟින් මානසික නිදහස හා එවැනි පීඩා ව්‍යක්ත කිරීමේහිලා ප්‍රවිෂ්ට වීමේ අවශ්‍යතාවයක් ඇත. විශේෂයෙන්ම ලිංගික ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ගැටළුවලට මුහුණ පෑ කාන්තාවන්හට ලිංගික සංවේදීතාව සැලකිල්ලට ගනිමින් මනෝ සමාජයීය සහාය ලබා දීමේ දී අර්ථවත් සහායක් ලබා දීමට නම් මෙය වටිනාකමක් සහිත බව සනාථ කරනු ඇත.

විශේෂඥයන් විසින් පෙන්වාදෙන පරිදි මනෝ සමාජයීය සහාය අවශ්‍ය වන අයගෙන් වැඩි ප්‍රතිශතයක් සාපේක්ෂ වශයෙන් සුළු ආකාරයේ හෝ මානසික ගැටළු වලින් පීඩා විඳින අතර, සුළු ප්‍රමාණයක් සංකීර්ණ මානසික/ මනෝමය තත්ත්වයන්ගෙන් පීඩාවිඳිනු ලබයි. එවැනි තැනැත්තන් සඳහා විශේෂඥ උපදේශනය හෝ මනෝවෛද්‍යවරුන්ගේ/ මනෝචිකිත්සකවරුන්ගේ ප්‍රතිකාර අත්‍යාවශ්‍යය වේ. මෙහිදී විවිධ ආකාරයේ අවශ්‍යතාවන් ගැන සැලකිලිමත් වෙමින් මනෝසමාජයීය සහාය පුළුල් කළ හැකි වන සේ, අවශ්‍ය විවිධ මට්ටම්වල මැදිහත්වීම් තක්සේරු කිරීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය හා හැකි අවස්ථාවන්හි දී අනෙකුත් රාජ්‍ය ආයතන හරහා දැනට පවතින රජයේ සම්පත් ඇතුළත් කරමින් ක්‍රියාත්මක කළ හැකි නිර්දේශක පද්ධතියක් සකස් කිරීම අවශ්‍ය වේ.

මානසික රෝග පිළිබඳ ඇති දුර්මත හා මානසික සෞඛ්‍ය සහ මනෝසමාජයීය සහාය පිළිබඳ ඇති අඩු දැනුවත්කම හේතුවෙන්, මනෝසමාජයීය සහය ලැබිය යුතු තැනැත්තන්, ඔවුන්ට මනෝසමාජයීය සහාය ලබා ගැනීම අවශ්‍යතාවක් ලෙස හඳුනානොගනී. එහෙයින්, එවැනි සහාය ඉල්ලීම් මත මුළුමනින්ම රඳා නොපවතින යාන්ත්‍රණයක් මේ සඳහා අවශ්‍ය වේ. පීඩාවට පත් තැනැත්තන්හට උපදේශනය, චිකිත්සාවන් හා අනෙක් සහායන් ලබා දීම ආදී වශයෙන් මෙකී සේවාවන්හි විෂය පථය පුළුල් කිරීම විශේෂයෙන්ම අවශ්‍ය වේ.

## VIII. ඒකීයබව, සංහිදියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම වැඩි දියුණුව සඳහා පියවර

හානිපූරණයන් ප්‍රදානය කිරීම මඟින් පීඩාවට පත් තැනැත්තන්ගේ තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සහාය ලබා දීම පමණක් නොව, පීඩාවට පත් තැනැත්තන් හට නිමාවක් වෙත ළඟාවීම, හා ප්‍රජාවන් අතර විශ්වාසය ගොඩනැංවීම සඳහා මානසික නිදහස පිළිබඳ වූ හරවත් ක්‍රියාවලියක් ආරම්භ කිරීම වඩාත් වැදගත් වේ. මෙය සමාව ලබාදීම, යෝජනා කිරීම හා ආනුෂංගික ප්‍රතිසන්ධානය සඳහා අත්‍යාවශය වේ. මේ මඟින් පුරවැසියා හට ඔහු/ ඇය නීතිය විසින් ආරක්ෂා කර ඇති බව, හා යම් අවස්ථාවකදී නීතිය උල්ලංඝනය වීම හෝ ඔහුට/ ඇයට යම් අයුරකින් හානියක් සිදු වූ විට රජය මැදිහත් වී හානිය සඳහා සහන ලබා දෙන බව හැඟවේ. මූලික වශයෙන්ම, රජය විසින් එකී පුරවැසියන් ආරක්ෂා කරන බවට මෙමඟින් වටිනා පණිවුඩයක් ලබා දෙයි.

හානිපූරණයන් ප්‍රදානය කිරීම මඟින් කවුරුන් විසින් හානිය සිදු කළේ ද යන්න නොසලකා රටෙහි සියළු පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා සහනයන් ලබාදීම රජයේ පූර්ණ කාර්යයභාරයක් ලෙස රජය විසින් එහි වගකීම පිළිගනු ලබයි. හානිපූරණයේ මූලිකම අරමුණ නම් තනි හා සමූහ පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා පිළිබඳ අවධානය යොමුකළ ද රට තුළ නැවතත් ප්‍රචණ්ඩත්වය යළි ඇති නොවීම සහතික කිරීම, හා කැබලි වී ඇති ශ්‍රී ලාංකික ජනයා එකසත් කිරීම වේ. පහත දක්වා ඇත්තේ එක්සත් සමාජයක් තැනීම සඳහා දායක කර ගත හැකි මැදිහත්වීම් වේ:

(i) අධ්‍යාපන පද්ධතිය ප්‍රතිසංධානය කිරීම - බහුවාර්ගික, බහුආගමික පාසල් පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම (දැනට වෙන් වෙන් වශයෙන් පවතින බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු යන පාසල් පද්ධතිය නිසා ඒකීය ශ්‍රී ලංකාවක් ලෙස හැඳින්විය හැකි විවිධත්වයකින් හෙබි බහුසංස්කෘතික, බහුවාර්ගික, බහු ආගමික ජාතියක් ඇති කරනවා වෙනුවට සමජාතීය සමාජයන් ප්‍රචාරණය කරයි);

(ii) ප්‍රජාවන් හට එකිනෙකා පිළිබඳව ඉගෙනීමට ඉඩ සලසන අන්තර් වාර්ගික හා අන්තර් ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කළ හැකි ලෙසට පාසල් විෂයමාලාව වෙනස් කිරීම, හා ජාතීන් අතර පවතින සමගිය හා සහජීවනයෙහි වටිනාකම පිළිබඳ පාසල් විෂයමාලා පාඩම්වලට ඇතුළත් කිරීම, සහ බෞද්ධාගමික ප්‍රතිපත්තියක් වන 'අවිහිංසා' ප්‍රතිපත්තිය ("කිසිදු ජීවියෙකුට පීඩාවක් නොකරන්න") ඇතුළු සියළු ආගමික ශාස්තෘවරුන් විසින් උගන්වන ලද ආගමික වටිනාකම් තරුණ සිත් වලට කාවැද්දීම;

(iii) සියලුම පාසල්වල භාෂාවන් තුනම හැදෑරිය යුතු අනිවාර්ය විෂයයන් බවට පත් කිරීම;

(iv) භාෂා අයිතීන් සඳහා තත්ත්වාකාර පිළිගැනීමක් ලබා දීම;

(v) අන්තර් කලාපීය සිසු හුවමාරු වැඩසටහන් දියුණු කිරීම;

(vi) ජාතීන් අතර සමඟිය හා සහජීවනය හා "ශ්‍රී ලාංකික" අනන්‍යතාවය වැඩිදියුණු කිරීමට රාජ්‍ය මාධ්‍ය මඟින් (සහ පෞද්ගලික මාධ්‍ය මඟින්) රජය විසින් මෙහෙයවනු ලබන ධනාත්මක ප්‍රචාරයක් ලබා දීම (ආගම හා/ හෝ ජනවාර්ගිකත්වය මත පදනම් වූ බෙදුණු අනන්‍යතාවයන්වලට විරුද්ධව);

(vii) ආයතනික හා ව්‍යූහමය ප්‍රතිසංස්කරණ;

(viii) රාජ්‍ය සේවයේ මානව හිමිකම් පුහුණුව හා මානව හිමිකම් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම;

(ix) නීති ප්‍රතිසංස්කරණය හා අධිකරණ ස්වෛරීභාවය ශක්තිමත් කිරීම;

(x) ආගමික වැදගත්කමක් ඇති ස්ථාන සහ ආගමික සංකේත ආරක්ෂා හා සංරක්ෂණය කිරීම;

(xi) ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම (ජාතීන් එකට ජීවත්වීම පිළිබඳව සිංගප්පූරුව විසින් ලබාගත් අත්දැකීම් දෙස බලා රජය විසින් නිවාස සංකීර්ණ ලබා දීමේ දී බෙදීගිය ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා මිත්‍රත්වය ප්‍රවර්ධනය කළ හැකි වන සේ, ජාතීන් සංකලනය කරමින් ජීවත්විය හැකි පරිදි නිවාස ඒකක ලබාදීම);

(xiii) අභ්‍යන්තර ජනාවාස ඇතුළුව විපතට පත් ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ඒ මඟින් පීඩාවට පත් තැනැත්තන් හට රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයේ ඇති සමාන සැලකීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම;

(xiii) පීඩාවට පත් තැනැත්තන් හට අධ්‍යාපනික, පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩසටහන් නිර්මාණය කිරීම;

(xiv) විපතට පත් ප්‍රදේශනයන්හි ප්‍රජා සංවර්ධන වැඩසටහන් හෝ සේවාවන් ඇති කිරීම.

## මාර්ගෝපදේශයන්

මූල්‍යමය වන්දි ප්‍රදානය කිරීම හා අනෙකුත් සහන ලබා දීමේ ක්‍රියාමාර්ග පිළිබඳ තීරණයන් පනතෙහි දක්වා ඇති ප්‍රතිපත්ති මත පදනම් විය යුතුය. විශේෂයෙන්ම, පනතෙහි 11(1)(උ) වගන්තියෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට අනුකූලව, ප්‍රදානය කරනු ලබන හානිපූරණයන් තීරණය කිරීමේදී පහත මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට නිර්දේශ කරනු ලැබේ:

### 1. වින්දිත කේන්ද්‍රීයතාව -

වින්දිතයන් කේන්ද්‍ර කොටගත් හානිපූරණ ප්‍රතිපත්ති පනතෙහි දක්වා ඇත[7]. ඉන් අදහස් වනුයේ තනි හා සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමේදී පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතාවන් අර්ථවත් ලෙස ආමන්ත්‍රණය කළ යුතු බවයි. වින්දිත අවශ්‍යතාවයන් වින්දිතයාගෙන් වින්දිතයාට, කලාපයෙන් කලාපයට මෙන්ම අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වේ. එමනිසා, පීඩාවට පත් තැනැත්තන්ගේ පුද්ගල අවස්ථා මත පදනම්ව හානිපූරණයන් ලබා දිය හැකි ආකාරයේ නම්‍යශීලී හානිපූරණ යෝජනා ක්‍රම යොදා ගත යුතු වේ. පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා මත පදනම්ව විෂයබද්ධ නිර්ණායක උපයෝගී කරගත හැකි ලෙස හානිපූරණ යෝජනා ක්‍රම නම්‍යශීලී හා පහසු ඒවා විය යුතුය.

### 2. සන්තාපයේ ස්වභාවය හා ඒවායේ බරපතලකමට අදාල වන නිර්ණායක ඇතුළුව පීඩාවට පත් තැනැත්තන් සඳහා හානිපූරණයන් ලබා ගැනීම පිළිබඳ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක -

අත්‍යාවශ්‍යම නිර්ණායකය නම් හානිපූරණයන් ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරන පුද්ගලයා පනතෙහි 27 වගන්තියෙහි දක්වා ඇති හේතූන් නිසා තම ඥාතියකුගේ ජීවිතය අහිමිවීමක් නිසා (පනතෙහි 27 වගන්තියෙහි දක්වා ඇති පරිදි) හෝ තුවාලවීමක ප්‍රතිඵලයක් ලෙස හානියකින් පීඩා විඳි හෝ දේපල හානිවීමකින් හෝ සමූහයක් ලෙස පීඩා විඳි කණ්ඩායමක් විය යුතුය. තවද, හානිය පිළිබඳව සත්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ.

පනතෙහි විධිවිධානයන්ට අනුව, හානිය/අහිමිවීම/අලාභය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද යන්න නොසලකා යම් තැනැත්තෙකු පීඩාවට පත් තැනැත්තෙකු ලෙස සලකා බලනු ලැබේ. උල්ලංඝන සිදු වූ අවස්ථාවන් පිළිබඳව විමර්ශනය කිරීමට බලයක් හෝ උල්ලංඝනය කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා හඳුනාගැනීම සඳහා ව්‍යවස්ථාපිත අධිකාරී බලයක් හානිපූරණය සඳහා වන කාර්යාලයට නොමැත.

ප්‍රමාණය හා ස්වරූපය ද ඇතුළුව, සන්තාපයේ ස්වභාවය හා බරපතලකම මත හා සිදු වූ හානියේ ප්‍රතිඵලයක් ලෙස පීඩාවට පත් තැනැත්තන් පත් වූ ප්‍රතිඵල තත්ත්වයන් මත පදනම්ව තනි හානිපූරණයන් වෙනස්විය හැකිය. ඒ අනුව, තනි හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී හානියේ හෝ විනාශයේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ පහත කරුණු කරුණු සඳහා අවධානය යොමු කළ යුතුය-

අ. මිය යෑමේ, අතුරුදහන් වීමේ හෝ පවුලේ සාමාජිකයකු ආබාධිත බවට පත් වීම නිසා ජීවත්ව සිටින්නන්ගේ මූල්‍යමය තත්ත්වය;

[7] 12(1)(ඇ) වගන්තිය

ආ. මිය යෑමේ, අතුරුදහන් වීමේ හෝ පවුලේ සාමාජිකයකු ආබාධිතබවට පත් වීම නිසා ජීවත්ව සිටින පවුලේ සාමාජිකයන්හට අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යෑම සඳහා කොපමණ දුරට සම්පත් අවශ්‍ය ද යන්න;

ඇ. සිදු වූ හානියේ සහ විනාශයේ ප්‍රතිඵලයක් ලෙස ජීවනෝපාය මාර්ගයන් සඳහා වූ බලපෑම සහ ආර්ථික බලගැන්වීමේ ක්‍රමෝපායන් සඳහා සහාය ලබා ගැනීමේ අවශ්‍යතාවය;

ඈ. සිදු වූ චිත්තවේගී හානියේ බරපතල බව හා නැවත සාමාන්‍ය තත්ත්වයට පත් වීම සඳහා අවශ්‍ය මැදහත්වීම්;

ඉ. පුද්ගලයාට සිදු වූ තුවාලයේ බරපතල බව හා ඒ හේතුවෙන් සිදු වූ ආබාධිත බවේ ප්‍රමාණය.

### 3. **යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය -**

හානිපූරණයන්ගේ ආකාරය ප්‍රතිපත්ති ලේඛනයේ සඳහන් පරිදි මැදිහත්වීම්වල ස්වභාවයෙන් විය යුතු අතර, හානිය ඥාතිවරයකුගේ මිය යෑමක් නිසා ඇති වූවක් ද, පීඩාවට පත් තැනැත්තෙකු හට සිදු වූ තුවාල වීමක් ද, එසේත් නැතිනම් ආබාධිත බවේ ප්‍රමාණය හෝ දේපල වලට සිදු වූ හානියක් හෝ විනාශයක් ද යන්න සලකා බැලීමෙන් අනතුරුව හානිපූරණයන්හි ප්‍රමාණය තීරණය කරනු ලබයි.

පනතෙහි දක්වා ඇති පරිදි, මූල්‍යමය වන්දි පිරිනැමීමේදී සම්පත්වල සුලභතාවය සලකා බැලෙන අතර එය සම්පූර්ණයෙන් එකවර ගෙවීම් කරන්නේ ද, අසමාන කොටස් වශයෙන් ගෙවීම් කරන්නේ ද යන්න තීරණය කළ යුතුය. වඩාත් බරපතල ආකාරයේ සන්තාපයන් ඇති පීඩාවට පත් තැනැත්තන් සඳහා මූල්‍යමය හානිපූරණ ලබා දීම සීමා කිරීමේ අවශ්‍යතාවය ද නිර්ණායකයක් වේ. සෑම අවස්ථාවකදීම, හානිපූරණයන් ප්‍රදානය කිරීමේදී මාර්ගෝපදේශයක් ලෙස පීඩාවට පත් තැනැත්තන්ගේ යහපත සලකා බලා හානිපූරණයන් ප්‍රදානය කරනු ඇත.

සහනයන්හි ආකාරය හා ප්‍රමාණය තීරණය කිරීමේදී, යම් පීඩාවට පත් තැනැත්තෙකු විසින් දැනටමත් ලබා ඇති සහනයන් ද සැලකිල්ලට ගනු ඇත.

### 4. **මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යභාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක -**

සම්පත්වල සුලභතාවය මත සියළුම පීඩාවට පත් තැනැත්තන් මූල්‍යමය වන්දි සඳහා යෝග්‍ය වේ. මෙය පනතෙහි දක්වා ඇති ප්‍රතිපත්තියකි.

පෙර සිදු වූ සිදුවීම් සඳහා ප්‍රදානය කරනු ලැබූ වන්දි ප්‍රමාණයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී මරණයක් සඳහා උපරිම රුපියල් මිලියනයක මුදලකුත්, වෛද්‍ය සහතිකය මත පදනම්ව එහි සඳහන් කර ඇති දුබලතාවයේ ප්‍රතිශතය අනුව පූර්ණ ආබාධිත බව සඳහා උපරිම රු. 500,000/= ක වන්දි මුදලකුත් ආදී වශයෙන් ආබාධිත බවට පත් වූ තැනැත්තන් සඳහා සමානුපාතික ලෙස වන්දි මුදල් ලබා දිය යුතු වේ. මෙම වන්දි මුදල් කාලීන වශයෙන් රුපියලේ අගය වැඩි වීම අනුව කලින් කලට සංශෝධනය කිරීම සිදු කළ යුතුය.

මූල්‍යමය වන්දි සැලකිල්ලට ගැනීමේ දී, ඇතැම් අවස්ථාවලදී හානිය නිසා ඇති වූ ක්ෂණික විපාක සඳහා අවශ්‍ය පියවර ගනු ලැබ තිබුණ ද, ඇතැම් විට පීඩාවට පත් තැනැත්තන් දිගු කාලීන වෛද්‍ය සහාය හෝ තවදුරටත් ආදායමක් ඉපයිය නොහැකි තත්ත්වයට පත් වී තිබීම හෝ නිවාස හෝ දේපල අහිමි වී තිබීම ආදී මහත් ලෙස අනාරක්ෂිත බවකින් පෙළීය හැකි බව සැලකිල්ලට ගත යුතුය. පනතෙහි දක්වා ඇති ව්‍යවස්ථාපිත විධිවිධාන වලට අනුකූලව, "පීඩාවට පත් තැනැත්තන්ගේ යහපත" ප්‍රධානතම නිර්ණායකය ලෙස සැලකිල්ලට ගත යුතුය[8]. එම නිසා, උචිත අවස්ථාවලදී ජීවනෝපාය මාර්ග ඇති කිරීම සඳහා අනෙකුත් ස්වරූප වලින් ද මූල්‍යමය සහාය ලබා දිය යුතු වේ.

පරිපාලනමය ප්‍රමාදවීම් හේතුවෙන් මූල්‍යමය වන්දි ප්‍රදානය කිරීමේ ප්‍රමාදයක් ඇති වන අවස්ථාවලදී, පිළිගතහැකි නිර්ණායකයක් මත පදනම්ව පීඩාවට පත් තැනැත්තා හට සාධාරණ අමතර මුදලක් පිරිනැමීම පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

## 5. **නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක** -

පීඩාවට පත් තැනැත්තන්ට හදිසි වෛද්‍ය අවශ්‍යතා ඇති වී තිබෙන අවස්ථා වලදී ආර්ථික තත්ත්වය පිරිහී ඇති විටක හා හදිසි තත්ත්වයන් සඳහා මූල්‍ය සම්පත් අවශ්‍ය වන විටක හා පීඩාවට පත් තැනැත්තන්හට වැඩිදුර හානි සිදුවීමේ අවධානමක් ඇති විටක, ඉක්මන් සහන ලබා දී නොමැති නම් නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් ප්‍රදානය කිරීම සැලකිල්ලට ගත යුතු වේ. ළමුන් හා සම්බන්ධ අවස්ථාවලදී ද, කම්පනයවීම් හා චිත්තවේගීය කැළඹීම් වැළක්වීම සඳහා හදිසි පදනමක් මත සහන ලබාදිය යුතු වේ.

## 6. **පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්-**

පනත[9] මඟින් දක්වා ඇති පරිදි හානිපූරණය සඳහා වන කාර්යාලය හට යම් රජයකින්, රාජ්‍ය, පළාත් හෝ පළාත් පාලන ආයතනයකින්, හෝ නියෝජිතායතනයකින්, හෝ එහි යම් නිළධරයකුගෙන්, හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින්, එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සහාය ඉල්ලා සිටීම සහ ලබා ගැනීමට හැකියාවක් ඇත. ඒ අනුව, හානිපූරණ කාර්යාලය විසින් හඳුනාගත් අවශ්‍යතා සඳහා අවධානය යොමු කොට සන්තාපය සඳහා ප්‍රතිචාර දැක්වීමේ අරමුණින් එක් එක් විෂය සඳහා වගකිවයුතු රේඛීය අමාත්‍යාංශ, රජයේ, පළාත් හෝ පළාත් පාලන අධිකාරීන්, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සහ අනෙකුත් සියළුම රජයේ අධිකාරීන්වල සහාය අපේක්ෂා කරනු ඇත.

ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට පෙර පවත්වනු ලැබූ තොරතුරු විමසීමේ වැඩසටහන් මත පදනම්ව සහන ලබාදීමේදී පහත දක්වා ඇති රාජ්‍ය ආයතන වඩාත් යෝග්‍ය බව හඳුනාගෙන ඇත - නිවාස, ඉඩම්, ජීවනෝපාය සංවර්ධන, ළමා හා කාන්තා කටයුතු, මාර්ග සංවර්ධන, සමාජ සේවා, වැඩිහිටි සත්කාර, සෞඛ්‍ය, අධ්‍යාපන, වෘත්තීය පුහුණු හා දිළිඳුකම තුරන් කිරීම ආදී විෂයන් සඳහා වගකිවයුතු

[8] 12(1)(ඈ)(v) වගන්තිය
[9] පනතේ 11(1)(ත) වගන්තිය

අමාත්‍යාංශ හෝ අනෙකුත් රාජ්‍ය නියෝජිතායතන. මෙහිදී පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා පිළිබඳ තක්සේරු කිරීමක් කිරීමෙන් අනතුරුව ඉහත සඳහන් කරන ලද හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් ලබාදිය යුතු හානිපූරණයන් පිළිබඳව නිර්දේශයන් සකස් කරනු ඇත.

ඊට අමතරව, යෝග්‍ය ලෙස සහාය ලබා දීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු හා දිළිඳුකම තුරන් කිරීම සම්බන්ධ වැඩසටහන් වල නිරතවන රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ද අපේක්ෂා කළ හැකිය.

7. **සත්‍යාපනය කරන ලද හානිපූරණ සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක** -

පීඩාවිඳින ලද හානියේ බරපතලකම, සහාය අවශ්‍ය වන හදිසි අවශ්‍යතාව හා/ හෝ ආසන්නතත්වය, පීඩාවට පත් තැනැත්තන්ගේ දරිද්‍රතා මට්ටම, හා පීඩාවට පත් තැනැත්තාගේ අනාරක්ෂිත බව මත පදනම්ව තනි හානිපූරණයන් ලබාදීමේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතු වේ. විශේෂයෙන්ම, පනතෙහි එන විධිවිධාන අනුව[10], තනි හානිපූරණයන් ප්‍රදානය කිරීමේදී කාන්තාවන්, ළමුන් හා ආබාධ සහිත තැනැත්තන් ආදී අනාරක්ෂිත තැනැත්තන් සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. අයදුම්පත් සඳහා ප්‍රමුඛත්වය ලබා දීමේදී අනෙකුත් කරුණු අතුරින් පහත කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය-

අ) අයදුම්කරු ඉතාමත් දිළිඳුභාවයට පත් වී ඇති අවස්ථාවකදී හා/ හෝ හදිසි කරුණක් ලෙස සහාය ලබාදීමේ අවශ්‍යතාව;

ආ) අයදුම්කරුගේ දිළිඳුබව හා අවශ්‍යතාවය අවම මට්ටමක පවතින විට;

ඇ) අයදුම්කරුහට ප්‍රමාණවත් ආදායම් ඉපැයීමේ හැකියාවක් ඇති නමුත් සන්තාපය හඳුනාගත් බව දැක්වීමක් ලෙස වන්දි ලබා දීම.

8. **තත්‍යභාවය සත්‍යාපනය කිරීමේ නිර්ණායක** -

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය අනුව හානිපූරණ රෙජීමය වින්දිත කේන්ද්‍රීය විය යුතු වීම යනු පීඩාවට පත් තැනැත්තන් හට හානිපූරණ ක්‍රියාවලිය සඳහා දැරිය හැකි ආකාරයේ පහසු ප්‍රවේශයක් තිබීමය. මෙහිදී, ගැටුම් අතරතුරදී හා අවතැන්වීම් අතරතුරදී පීඩාවට පත් තැනැත්තන් විශාල සංඛ්‍යාවකගේ වටිනා පෞද්ගලික ලිපිලේඛන හා උල්ලංඝනයවීම් පිළිබඳ සහතික විනාශ වී හෝ අස්ථානගත වී තිබීම හෝ ඒවා ලබා ගැනීමට නොහැකිවීම විශේෂයෙන්ම හඳුනාගත යුතුය. එම නිසා සහන සඳහා යෝග්‍යතාව හඳුනාගැනීමේදී වඩාත් නම්‍යශීලී ප්‍රවේශයක් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

ඒ හේතුවෙන්, පනතේ හරය තහවුරු කිරීමේදී, දීර්ඝ ලිපිලේඛන හා කාර්යපටිපාටිවල අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් මෙම ක්‍රියාවලිය සංකීර්ණ නොකිරීමට සැලකිලිමත්වනු ඇත. අයදුම්කරුවන්ගෙන් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශවලින් පැමිණෙන බවත්, විස්තරාත්මක ලේඛන හෝ විභාග කිරීම් ඇතුළුව විධිමත් ක්‍රියාපටිපාටියක නිරතවීමට තරම් දැනුමක්, ධාරිතාවක් හෝ සහන සුරක්ෂිත කිරීම සඳහා මූල්‍යමය සම්පත් නොමැති බවත් මනසේ තබාගෙන, තහවුරු කිරීමේ ක්‍රියාවලිය සරල, පරිශීලනයට හා ප්‍රවේශයට පහසු එකක් බවට පත් කළ යුතුය. තත්‍යභාවය තහවුරු කිරීම සඳහා වන පරීක්ෂණය සාධාරණ එකක් විය යුතු වේ, එනම් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් යෝග්‍යතාවය සඳහා සාධාරණ හා විශ්වාසනීය සාක්ෂි පිළිගනු ඇත.

---

[10] පනතේ 12(1)(ඇ) හා (ඈ) වගන්ති

9. **මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම හා ස්මාරක සඳහා වන නිර්ණායක -**

පනතෙහි දක්වා ඇති පරිදි අනුස්මරණය කිරීම යනු මියගිය තැනැත්තන්ගේ පවුල් වලට හා ආදරණීයයන්ට ශෝකය ප්‍රකාශ කිරීමට ඇති චිත්තවේගීය අවශ්‍යතාවය, මියගිය තැනැත්තන් අනුස්මරණය හා සිහිපත් කිරීම මිස, දේශපාලනික සටන් පාඨ හෝ විරෝධතා ලෙස මහජන ප්‍රදර්ශනයක් සිදු කිරීම ඉන් අදහස් නොකරයි. පනත යටතේ අදහස් කර ඇති සාමූහික වින්දිතයන් හට සිදු කරන ප්‍රදානයක් ලෙස, කිසිදු වෙනස්කමකට භාජනය නොකර සම්පූර්ණ ගැටුම පුරාවටම මියගිය තැනැත්තන් අනුස්මරණය කරමින් හෝ, විශේෂයෙන් පාස්කු ඉරුදින ප්‍රහාරය වැනි සිදුවීම් අතරතුරදී මියගිය තැනැත්තන් අනුස්මරණය කරමින් එනම් උදාහරණයක් ලෙස උද්‍යානයක් වැනි පොදු අවකාශයක් ඔවුන් වෙනුවෙන් නම් කිරීම හෝ, අතීතයේ සිට ජාතීන් අතර පැවති සමඟියේ ඉතිහාසය විදහා දැක්වෙන ආකාරයේ කෞතුකාගාරයක් ඔවුන් වෙනුවෙන් ඉදි කිරීම ආදිය අදහස් කරන අතර ත්‍රස්තවාදීන් හෝ බෙදුම්වාදීන් කුමන ආකාරයකින් හෝ අනුස්මරණය කිරීම මෙයට ඇතුළත් නොවේ.

10. **පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම -**

පීඩාවට පත් විශේෂිත පුද්ගල කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා හඳුනාගැනීමේදී, ඔවුන්ගේ තත්ත්වයන් මත පදනම්ව, පහත දක්වා ඇති සුවිශේෂී කණ්ඩායම් ද ඇතුළුව එවැනි විශේෂ අවශ්‍යතා ඇති කණ්ඩායම්වල අවශ්‍යතා සපුරාලීම සඳහා වන සුවිශේෂී හානිපූරණයන් හානිපූරණ වැඩසටහනට ඇතුළත් කළ යුතුය -

අ. කාන්තාවන්;
ආ. ළමුන්;
ඇ. වැඩිහිටි පුද්ගලයන්;
ඈ. රජයේ හමුදාවන්, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආබාධිත තත්ත්වයට පත් වූ නිලධාරීන් ද ඇතුළුව ආබාධ සහිත තැනැත්තන්;
ඉ. අවතැන් වූ පුද්ගලයින්;
ඊ. රජයේ හමුදාවන්, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයන් ද ඇතුළුව අතුරුදහන් වූ/ මියගිය තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන්;
උ. ලිංගික හිංසනයන්ට ගොදුරු වූවන්;
ඌ.හිටපු ළමා සොල්දාදුවන් ද ඇතුළුව පුනරුත්ථාපනය කරන ලද හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්;